මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021 ජූලි මස 08 දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය: අංක 05-2021 ජූලි

## ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේ පවත්වාගනී

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය 2021 ජූලි මස 07 වැනි දින පැවති රැස්වීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 4.50 සහ සියයට 5.50 ලෙස දැනට පවතින මට්ටමේ පවත්වාගෙන යෑමට තීරණය කළේය. දේශීය සහ ගෝලීය වශයෙන් වන සාර්ව ආර්ථික තත්ත්වයන් සහ අපේක්ෂිත වර්ධනයන් මනාව සලකා බැලීමෙන් අනතුරුව මුදල් මණ්ඩලය මෙම තීරණයට එළඹුණි.

### ශ්‍රී ලංකා ආර්ථිකය 2021 වසරේ පළමු කාර්තුව තුළදී අපේක්ෂිත මට්ටමට වඩා වැඩි වර්ධනයක් වාර්තා කර ඇතැයි පෙන්නුම් කෙරේ.

2021 වසරේ පළමු කාර්තුව සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර නොමැති වුවද, ආර්ථිකයේ ප්‍රධාන අංශ කිහිපයක් සඳහා වන දර්ශක මගින් මෙම කාර්තුව තුළ දී අපේක්ෂිත මට්ටමට වඩා වැඩි වේගයකින් ආර්ථිකය යථා තත්ත්වයට පත් වී ඇති බවට පෙන්නුම් කරයි. කොවිඩ්-19 වසංගතයේ තුන්වන රැල්ල සහ ඒ ආශ්‍රිත වසංගත තත්ත්වය වැළැක්වීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් දේශීය ආර්ථික කටයුතුවලට ඇති වූ බාධා මගින් 2021 වසරේ දෙවන කාර්තුව තුළ දී ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම තරමක් දුර්වල කළේය. කෙසේ වුව ද, දිවයින පුරා දැනට ක්‍රියාත්මක වන එන්නත්කරණ ක්‍රියාවලිය සහ සංචරණ සීමා ඉවත් කිරීම මගින් දැනට පවතින කොවිඩ්-19 රැල්ල තුළින් සමස්ත ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි ඇති කරන බලපෑම අඩු කෙරෙනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් 2021 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය සියයට 5ක් පමණ ළඟා කර ගනිමින් තිරසාර

ආර්ථිකය පුනර්ජීවනයක් සඳහා පහසුකම් සලසනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය ආර්ථිකයෙහි අපේක්ෂිත යථා තත්ත්වයට පත් වීම සහ දේශීය ආර්ථිකයෙහි වැඩිදියුණු වීම් සමඟ, ආර්ථික ක්‍රියාකාරකම් වර්ධනය වීම මැදි කාලීනව තිරසාරව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## ඉදිරි කාලය තුළ දී විදේශීය අංශය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ

අපනයනයන්හි ස්ථාවර භාවයක් පෙන්නුම් කළ ද, පසුගිය වසරේ අනුරූපී කාලය හා සැසඳීමේ දී 2021 ජනවාරි සිට මැයි දක්වා කාලය තුළදී වෙළඳ හිඟය පුළුල් විය. දේශීයව මෙන්ම ගෝලීය වශයෙන් ඇති වූ කොවිඩ්-19 වසංගතයේ විවිධ රැලි මගින් වූ අභියෝග හමුවේ සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත්වීම කෙරෙහි අඛණ්ඩ බාධා ඇති විය. කෙසේ වුවද, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් සැලකිය යුතු ලෙස වර්ධනය වීම මගින් විදේශීය ජංගම ගිණුමට අඛණ්ඩව සහාය සපයනු ලබයි. විදේශීය අංශයෙහි ඇති අභියෝග මැඩලීම සඳහා හඳුන්වා දී ඇති ක්‍රියාමාර්ග දේශීය විදේශීය විනිමය වෙළඳපොළ තත්ත්වය යම් මට්ටමකට වර්ධනය වීමට උපකාරී වූ අතර, සමපේක්ෂණ හැසිරීම් සහ ආනයන භාණ්ඩ කල්තියා ඇනවුම් කිරීමට පෙළඹවීම වෙළඳපොළ තුළ අනවශ්‍ය පීඩන ඇති වීමට හේතු වී තිබේ. 2021 වසරේ මේ දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 6.7ක අවප්‍රමාණය වීමක් වාර්තා විය. 2021 ජූනි මස අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් බිලියන 4.0ක් ලෙස ඇස්තමේන්තු කර ඇත (ආනයන මාස 2.7කට සමාන). චීන යුවාන් රෙන්මින්බි බිලියන 10ක (ආසන්න වශයෙන් එක්සත් ජනපද ඩොලර් බිලියන 1.5ට සමාන) අගයකින් යුතු චීන මහජන බැංකුව සමඟ ඇති කරගත් ද්විපාර්ශ්වික මුදල් හුවමාරු පහසුකම මෙයට ඇතුළත් නොවේ. ඉදිරි කාලය තුළදී විදේශ සංචිත මට්ටමේ යම් උච්චාවචන පැවතිය හැකි වුව ද, එවැනි උච්චාවචන තාවකාලික වනු ඇතැයි ද, අපේක්ෂිත විදේශ විනිමය ප්‍රවාහ තුළින් සංචිත ප්‍රමාණවත් මට්ටමින් පවත්වා ගැනීමට සහ රජයේ කල්පිරෙන ණය සේවාකරණ වගකීම් නියමිත වේලාවට සපුරාලීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## වෙළඳපොළ පොලී අනුපාතික අඩු මට්ටමක පවතින අතර එමගින් පෞද්ගලික අංශය සඳහා ණය ගලා යෑම් වර්ධනය වීම සඳහා පහසුකම් සැලසීය

මහ බැංකුව විසින් අනුගමනය කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර වශයෙන් බොහෝ වෙළඳපොළ තැන්පතු සහ ණය පොලී අනුපාතික ඒවායේ මෙතෙක් වාර්තා වූ අවම මට්ටම් කරා අඩු වී ඇත. පවත්නා අඩු පොලී අනුපාතික සහ දේශීය මුදල් වෙළඳපොළ තුළ පවතින අතිරික්ත රුපියල් ද්‍රවශීලතාව හේතුවෙන් ආර්ථිකයට අඩු පිරිවැයකින් යුතු ණය ගලායෑම සිදු වූ අතර එමගින් ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය සඳහා සහාය විය. ඒ අනුව, 2021 ජනවාරි සිට මැයි මාසය දක්වා කාලය තුළ දී පෞද්ගලික අංශයට ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර මෙම වර්ධනය 2021 වසර පුරා පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. දේශීය ආයෝජකයින් ඔවුන්ගේ ඵලදායී ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් කිරීම සඳහා අඩු පොලී අනුපාතික පරිසරය භාවිතා කරනු ඇති බවට සහ දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් ආර්ථිකය තුළ නිර්මාණය වෙමින් පවතින නව අවස්ථා උපයෝගී කරගනු ඇතැයි මහ බැංකුව අපේක්ෂා කරයි. මේ අතර, කොවිඩ්-19 වසංගතය මගින් රජයේ ආදායම හා පුනරාවර්තන වියදම් මත ඇති වූ බලපෑම මධ්‍යයේ රාජ්‍ය අංශය, විශේෂයෙන්ම රජය, බැංකු පද්ධතියෙන් ලබා ගත් ණය ද සැලකිය යුතු ලෙස ඉහල ගියේය. දේශීය ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑමත් සමඟ 2021 මැයි අවසානය වන විට පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වර්ධනය ඉහළ මට්ටමක පැවතුණි.

## උද්ධමන පීඩන ඇතිවුවහොත් ඒ සඳහා මැදි කාලීනව සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත

අඩු සමස්ත ඉල්ලුම් තත්ත්ව සමඟ උද්ධමනය අඩු මට්ටමක පැවතුන ද සැපයුම් අංශයේ බාධාවන් හේතුවෙන් ආහාර උද්ධමනය ඉහළ ගියේය. 2021 වසරේ ඉතිරි කාලය තුළ දී උද්ධමනය අපේක්ෂිත සියයට 4-6 අතර පරාසය තුළ පුළුල්ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් අනුගමනය කරන ලද උත්තේජක ක්‍රියාමාර්ගවල බලපෑම හේතුවෙන් සමස්ත ඉල්ලුම් තත්ත්වයේ ඇති විය හැකි අපේක්ෂිත වර්ධනයන් සහ ගෝලීය වෙළඳපොළෙහි භාණ්ඩ මිල ගණන් ඉහළ යෑමට ඇති හැකියාව හේතුවෙන් මැදි කාලීනව යම් උද්ධමන පීඩන ඇති විය හැකිය. ශ්‍රී ලංකා මහ බැංකුවේ කාලෝචිත ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හරහා එවැනි පීඩන අවමකර ගැනීමට හැකි වනු

ඇති අතර, එමඟින් මැදි කාලීනව උද්ධමනය මැදි තනි අගයක මට්ටමේ පවත්වා ගැනීමට හැකිවනු ඇත.

## ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේ පවත්වා ගැනෙයි

ඉහත සඳහන් කළ පරිදි පවත්නා සහ අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රවණතා සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 4.50 සහ සියයට 5.50 ලෙස දැනට පවතින මට්ටමේ පවත්වාගෙන යෑමට මුදල් මණ්ඩලය තීරණය කළේය. මහ බැංකුව විසින් දේශීය හා ගෝලීය සාර්ව ආර්ථික සහ මූල්‍ය වෙළඳපොළ ප්‍රවණතා අඛණ්ඩව නිරීක්ෂණය කරනු ඇති අතර ආර්ථිකය තිරසාරව යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය දක්වමින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ මැදි කාලීනව ඉලක්කගත සියයට 4-6 අතර පරාසයක උද්ධමනය පවත්වා ගැනීමේ අරමුණ ඇතිව අවශ්‍ය අවස්ථාවන්හි දී සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සූදානමින් සිටියි.

**මුදල් ප්‍රතිපත්ති තීරණය : ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය නොවෙනස්ව පවතී**

| | |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | සියයට 4.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | සියයට 5.50 |
| බැංකු අනුපාතිකය | සියයට 8.50 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 2.00 |

**තොරතුරු සටහන:**

මුදල් ප්‍රතිපත්ති විවරණ මාධ්‍ය හමුව 2021 ජූලි මස 08 වැනි දින පෙ.ව. 11.00 ට Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වෙන අතර එය ෆේස්බුක් ඔස්සේ සජීවීව විකාශය කෙරේ.

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය 2021 අගෝස්තු මස 19 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

**ඇමුණුම 1**

## සංඛ්‍යා සටහන 01: උද්ධමනය

| මාසය | | නොවැ 20 | දෙසැ 20 | ජන 21 | පෙබ 21 | මාර් 21 | අප්‍රේ 21 | මැයි 21 | ජූනි 21 |
|---|---|---|---|---|---|---|---|---|---|
| මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස) | කො.පා.මි.ද. (2013=100) | 4.1 | 4.2 | 3.0 | 3.3 | 4.1 | 3.9 | 4.5 | 5.2 |
| | ජා.පා.මි.ද. (2013=100) | 5.2 | 4.6 | 3.7 | 4.2 | 5.1 | 5.5 | 6.1 | - |
| මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස) | කො.පා.මි.ද. (2013=100) | 3.0 | 3.5 | 2.7 | 2.6 | 3.1 | 3.0 | 3.2 | 3.2 |
| | ජා.පා.මි.ද. (2013=100) | 4.5 | 4.7 | 4.2 | 4.1 | 4.3 | 4.1 | 4.2 | - |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## සංඛ්‍යා සටහන 02: මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| දර්ශකය | ප්‍රමාණය (රුපියල් බිලියන) | | | | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජන 21 | පෙබ 21 | මාර් 21 | අප්‍රේ 21 | මැයි 21 | ජන 21 | පෙබ 21 | මාර් 21 | අප්‍රේ 21 | මැයි 21 |
| සංචිත මුදල් | 976 | 978 | 1,029 | 1,031 | 1,036 | 4.3 | 1.5 | 1.5 | 0.9 | 4.0 |
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 9,533 | 9,651 | 9,839 | 9,947 | 10,033 | 23.7 | 23.8 | 21.5 | 20.4 | 21.0 |
| ශුද්ධ විදේශීය වත්කම් | (321) | (386) | (430) | (431) | (429) | -458.9 | -496.1 | -1,629.0 | -615.8 | -778.2 |
| ශුද්ධ දේශීය වත්කම් | 9,854 | 10,037 | 10,269 | 10,378 | 10,462 | 29.4 | 30.4 | 27.2 | 26.9 | 25.4 |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය | 4,758 | 4,793 | 5,005 | 4,965 | 5,024 | 63.1 | 61.9 | 54.7 | 50.4 | 45.0 |
| රාජ්‍ය සංස්ථා සඳහා ලබා දුන් ණය | 1,058 | 1,080 | 1,098 | 1,093 | 1,113 | 29.0 | 29.7 | 26.5 | 17.1 | 16.8 |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය | 6,197 | 6,276 | 6,388 | 6,446 | 6,501 | 6.9 | 7.8 | 7.5 | 8.2 | 10.5 |
| පුළුල් මුදල් සැපයුම ($M_4$) | 11,643 | 11,790 | 12,010 | 12,154 | 12,265 | 21.6 | 21.9 | 20.4 | 19.6 | 20.2 |

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

## සංඛ්‍යා සටහන 03: පොලී අනුපාතික

| පොලී අනුපාතික (%) | 2021 ජන අවසානයට | 2021 පෙබ අවසානයට | 2021 මාර් අවසානයට | 2021 අප්‍රේ අවසානයට | 2021 මැයි අවසානයට | 2021 ජූනි අවසානයට | 2021 ජූලි 07 දිනට |
|---|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 4.50 | 4.50 | 4.50 | 4.50 | 4.50 | 4.50 | 4.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 5.50 | 5.50 | 5.50 | 5.50 | 5.50 | 5.50 | 5.50 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 4.55 | 4.55 | 4.62 | 4.64 | 4.66 | 4.93 | 4.93 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | | |
| දින 91 | 4.69 | 4.90 | 5.05 | 5.11 | 5.13 | 5.18 | 5.19 |
| දින 182 | 4.75 | 4.99 | 5.10 | 5.14 | 5.14 | 5.19 | 5.19 |
| දින 364 | 4.98 | 5.09 | 5.11 | 5.18 | 5.18 | 5.23 | 5.23 |
| **ණය අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) (සතිපතා) | 5.90 | 5.76 | 5.78 | 5.86 | 5.65 | 5.51 | - |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) | 10.17 | 10.08 | 9.91 | 9.73 | 9.64 | - | - |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) | 8.37 | 8.26 | 8.28 | 7.95 | 7.74 | - | - |
| **තැන්පතු අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 5.58 | 5.36 | 5.20 | 5.07 | 4.97 | 4.87 | - |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 6.88 | 6.53 | 6.29 | 6.09 | 5.94 | 5.82 | - |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 5.19 | 4.96 | 4.86 | 4.77 | 4.77 | - | - |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 5.30 | 5.09 | 4.99 | 4.92 | 4.90 | - | - |

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*